ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ මූලධන වියදම් ලෙස දැක්විය යුතු රු.1,011,202 ක වටිනාකම භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස දක්වා තිබුණි.	එකඟ වේ. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේනතුව විසින් හඳුන්වා දී ඇති මූල්‍ය ප්‍රකාශන ආකෘතියන් හි, ඒසීඒ-සී ආකෘතිය අනුව මූලධන වියදම් වටිනාකම ඒසීඒ-සී ආකෘයෙහි වෙනත් ආයෝජන අත්කරගැනීම් ලෙස සලකා මුළු මූලධන වියදමෙහි එකතුව වන රු. 1,011,202 ලෙස ගලපා ඇත.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) භාණ්ඩාගාර පරිසනක මුද්‍රිත සටහන් SA 11 අනුව 242-1-1-0-1003 (වෙනත් දීමනා) වැය විෂයයට මු.රෙ 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම වූ රු. 582,440 ක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ඒසීඒ 2(ii) වියදම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.	එකඟ වේ. අතපසුවීමකින් ඒසීඒ 2(ii) වියදම් ප්‍රකාශනයේ මු.රෙ. 208 යටතේ වැය විෂය 1003 ට අදාළ වටිනාකම වන රු. 582,440 දක්වා නොමැත.	ඒසීඒ 2(ii) වියදම් ප්‍රකාශනයේ SA 11 අනුව, මු.රෙ 208 යටතේ වියදම නිවැරදිව දැක්විය යුතු වීම.

(ii)	ඒසීඒ 2 (ii) වියදම් ප්‍රකාශනයේ වැය විෂයය අංක 242-1-1-0-1003 යටතේ මුදල් පොතට අනුව වියදම රු.34,980,163 ක් වුවත්, රු.35,562,603 ලෙස දක්වා තිබීමෙන් එම අගය රු.582,440 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ඉහත (i) පිළිතුරට අනුව, මු.රෙ. 208 යටතේ දැක්විය යුතු වටිනාකම වන රු. 582,440 ද ඇතුළත්ව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 10 අනුව වැය විෂය 1003 යටතේ වූ මුළු වියදම වන රු. 35,562,603 මුළු වියදම් තීරුවෙහි දක්වා ඇති බැවින් මුළු වටිනාකමට බලපෑමක් සිදු වී නොමැත.	ඒසීඒ 2(ii) වියදම් ප්‍රකාශනයේ මුදල් පොතට අනුව නිවැරදි අගය දැක්විය යුතු වීම.
(iii)	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට අනුව අනෙකුත් භාණ්ඩ හා සේවාවල වියදම (සටහන 6) රු.42,131,393 වුවත්, වියදම් ප්‍රකාශනයට (ඒසීඒ 2(ii)) අනුව වියදම රු.121,455,094 ක් ලෙස දක්වා තිබීමෙන් රු.79,323,701 ක වෙනසක් නිරීක්ෂණය විය.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය ප්‍රකාශන ඒසීඒ-2(ii) ආකෘතිය අනුව සටහන 5හි මුළු එකතුව දැක්වීම සඳහා තීරුවක් නොමැති බැවින් එහි එකතුව (අ) යටතේ දක්වා ඇත.	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වියදම නිවැරදිව දැක්විය යුතු වීම.

(ආ) දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මූල්‍ය නොවන වත්කම් අපහරණය කිරීම් වටිනාකම රු.11,340 ක් වුවද, එය රු.100,340 ක් ලෙස දක්වා තිබීම නිසා අපහරණය කිරීම් වටිනාකම රු.89,000 කින් වැඩියෙන් පෙන්වා තිබුණි.	විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති රු. 89000 ක වටිනාකම වත්කම් ඇතුළත් කිරීමේදී සිදු වූ වැරදි නිවැරදි කිරීමක ද්විත්ව සටහනක් බවද සිගාස් පද්ධතියෙහි අපහරණ ලැයිස්තුවෙහි එම අගය වැරදි නිවැරදි කිරීම් යටතේ	මූල්‍ය නොවන වත්කම් අපහරණ වටිනාකම නිවැරදිව දැක්විය යුතු වීම.
(ii)	වෙනත් ආයතන විසින් දෙපාර්තමේන්තුව වෙත මූල්‍ය නොවන වත්කම් පවරා දීම් (Transfer in) වල වටිනාකම රු.852,800 ක් වුවද, එය රු.941,800 ලෙස දක්වා තිබීමෙන් රු.89,000 ක් වැඩියෙන් පෙන්වා තිබුණි.	පෙන්නුම් කරන බවද එනම්, රු. 100,340 තුළ වැරදි නිවැරදි කිරීම්හි අගය වන රු. 89,000 ක් ද පෙන්නුම් කරන බවද එම වටිනාකම මූල්‍ය නොවන වත්කම්හි කේවල ශේෂයන් වෙත කිසිදු බලපෑමක් සිදු නොවේ.	මූල්‍ය නොවන වත්කම් පවරා දීම් වල වටිනාකම නිවැරදිව දැක්විය යුතු වීම.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එක් පුනරාවර්තන වැය විෂයයකට හා මූලධන වැය විෂයයන් හතරක් සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන එකතුව රු.5,300,000 කින් එකතුව වූ රු.3,503,236 ක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරිව තිබූ අතර එම ඉතිරිය සියයට 35 සිට සියයට 100 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.	දේපළ ණය ලබාගත් නිලධාරීන් ස්ථාන මාරු වී යෑම හා අපේක්ෂා කළ පරිදි නිලධාරීන් දේපළ ණය ලබා නොගැනීම හා ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව රාජ්‍ය වියදම පාලනය කිරීම සඳහා පියවර ගැනීම හේතුවෙන් එම වැය විෂයන් වල ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	මු.රෙ. 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්විකව වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කල යුතු වීම.
(ආ)	පුනරාවර්තන වැය විෂයයකට අදාලව ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.400,000 න් මු.රෙ.66 මඟින් රු.150,000 ක් වෙනත් වැය විෂයයකට මාරු කල පසුද, රු.127,980 ක් ඉතිරි වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 ක් විය.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව රාජ්‍ය වියදම පාලනය කිරීම හා අවම පිරිවැයක් යටතේ වාහන රක්ෂණාවරණ ලබා ගැනීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	- එම -
(ඇ)	පුනරාවර්තන වැය විෂයයන් 03කට අදාලව එකතුව රු.2,250,000 කින් හෙවත් සියයට 33 සිට 44 දක්වා වූ පරාසයකින් මු.රෙ 66 මඟින් ප්‍රතිපාදන වැඩිකරගෙන තිබුණි.	කලින් සැලසුම් නොකරන ලද හා අනපේක්ෂිත ලෙස පැන නැඟුනු විදේශ පුහුණු වියදම්, වාහන අළුත්වැඩියා වියදම් සහ යන්ත්‍රෝපකරන අළුත්වැඩියා වියදම් දැරීම සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එම වැය විෂයන් සඳහා මු.රෙ.66 මඟින් ප්‍රතිපාදන මාරු කර ගැනීමට සිදු වී ඇත.	- එම -

3.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ මුදල් පොත අනුව, 2024 ඔක්තෝබර් මසදී නිලධාරීන් තිදෙනෙකු සඳහා මැතිවරණය වෙනුවෙන් එකතුව රු.581,244 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණද එම ගෙවීම අත්තිකාරම් ලේඛනයේ සටහන් කර නොතිබූ අතර එම අත්තිකාරම් පියවූ බවට විගණනයේදී අනාවරණය නොවීය.	මැතිවරණ රාජකාරි සඳහා ගෙවීම් කිරීමේදී පෙන්වා දී ඇති පරිදි අත්තිකාරම් ගෙවීම් කිරීමේදී හා පියවීමේදී අත්තිකාරම් පොතෙහි අදාළ ගණුදෙනු කිහිපයක් යාවත්කාලීන කිරීම අතපසු වී ඇත.	අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම් අත්තිකාරම් ලේඛණයේ නිවැරදිව සටහන් කළ යුතු වීම.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් ක්‍රියාකාරකම්වලට අදාලව ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම (Out Put) අපේක්ෂිත ප්‍රතිඵලය (Out Come) දක්වා නොතිබුණි. එමනිසා එහි ප්‍රගතිය සංසන්දනය කිරීමට නොහැකි විය. දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී එහි මූල්‍ය ප්‍රගතිය වගකීම් ක්ෂේත්‍රය හා ක්‍රියාකාරකම් අනුව වෙන් වෙන්ව නොදක්වා පොදුවේ දක්වා තිබුණු අතර භෞතික ප්‍රගතියද එක් එක් ක්‍රියාකාරකම් අනුව වෙන් වෙන්ව නොදක්වා වගකීම් ක්ෂේත්‍රය අනුව පොදුවේ ප්‍රතිශතයක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව එම ප්‍රගතිය ගණනය කිරීමේ නිවැරැදිතාවය විගණනයේදී තහවුරු නොවුණි.	රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල හා පාරිශ්‍රමික කළමනාකරණය වගකීම් ක්ෂේත්‍රය යටතේ ඇති සියළුම ක්‍රියාකාරකම්වල සමස්ත ප්‍රගතිය ආයතනික මට්ටමින් දක්වා ඇත.	රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියල කළ යුතු වීම.

(ආ)	ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබූ පහත වගකීම් ක්ෂේත්‍රයන් යටතේ වූ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කාර්යභාරය ඉටුකර ගත් බවට ප්‍රගති වාර්තාවෙහි දක්වා නොතිබුණි. (i)රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල හා පාරිශ්‍රමික කළමනාකරණ වගකීම් ක්ෂේත්‍රය යටතේ - කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සමාලෝචනය කිරීම • කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය ,රෝහල • පළාත් සභා කාර්ය මණ්ඩල • පාසල් පාදක කාර්ය මණ්ඩලය - දේශීය හා විදේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා හඳුනාගනු ලැබූ විශේෂඥ දැනුමක් සහිත තනතුරු අනුමත කිරීම	විගණන ඡේදයට අදාලව පිළිතුරු දී නැත.	ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතු වීම.
	(ii)රාජ්‍ය සංස්ථා හා මණ්ඩල සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි කාර්යය මණ්ඩලය බඳවා ගැනීම හා උසස් කිරීම ප්‍රමිතගත කිරීම වගකීම් ක්ෂේත්‍රය යටතේ - මෙතෙක් බඳවා ගැනීම් පරිපාටි අනුමත කර නොමැති පහත සඳහන් ආයතනවල බඳවා ගැනීම් පරිපාටි අනුමත කිරීම • විශ්ව විද්‍යාල • ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව • මාර්ග සංවර්ධන අධිකාරිය	දක්වා ඇති ආයතන වල කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටියට අදාළ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂා කරයි.	විගණන ඡේදයට අනුව දක්වා ඇති ආයතන වල බඳවා ගැනීමේ පටිපාටි අනුමත කිරීමට කටයුතු කල යුතු වීම.

4.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) දත්ත පද්ධතිය පවත්වාගෙන යාම		
භාණ්ඩාගාර ලේකම් සහ මුදල් හා ක්‍රමසම්පාදන ලේකම්ගේ අංක DMS/E/1/99 හා 1999 මැයි 05 දිනැති චක්‍රලේඛය අනුව පිහිටුවන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රථම පියවර වශයෙන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව තුළ පොදු දත්ත මූලාශ්‍රයන් පිහිටුවීමට හා විවිධ නියෝජිත ආයතන අතර අපිළිවෙලට විසිර පවත්නා දත්ත, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යටතේ ඒකාබද්ධ කොට යාවත්කාලීන කොට කේන්ද්‍රගත කිරීමට යෝජනා වී තිබූ අතර, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ලෙසට රාජ්‍ය අංශයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සේවක පිරිස පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණි. එසේවුවද, දෙපාර්තමේන්තුව පිහිටුවා සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 24 ක පමණ කාලයක් ගතවී තිබුණ ද, දත්ත පද්ධතියක් නිර්මාණය කර අදාල යාවත්කාලීන තොරතුරු පවත්වාගැනීමට අපොහොසත් වී තිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සඳහා දැනට, අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු පවත්වාගෙන යාමට දත්ත පද්ධති දෙකක් දැනට ක්‍රියාත්මක වේ. එය ලේඛනගත දත්ත හා පරිගණකගත දත්ත ගබඩාවක සම්මිශ්‍රණයක් ලෙස ක්‍රියාත්මක වේ. කාර්යක්ෂම කළමනාකරණ තොරතුරු පද්ධතියක් (Management Information System - MIS) ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඒ සඳහා (i) මහා භාණ්ඩාගාරය සඳහා දැනට ක්‍රියාත්මක ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියේ (ITMIS), විශේෂිත මානව සම්පත් මොඩියුලය (HR-Module), දත්ත පද්ධතිය ලෙස භාවිතා කිරීමට අදාල කටයුතු ආරම්භ කිරීම. (ii) පළාත් සභා සහ රාජ්‍ය ව්‍යවසායන් හි අනුමත කාර්ය මණ්ඩලය සම්බන්ධව මුදල් අමාත්‍යාංශයේ, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව (ITMD) සමග එක්ව Cadre Management Information System (CMIS) නමින් පරිගණක දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීමට කටයුතු ආරම්භ කර ඇත.	ප්‍රමාදයන්ගෙන් තොරව සැලසුම්වලට අනුකූලව කටයුතු කළ යුතු වීම.
(ආ) තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු පවත්වාගෙන යාම		
2017 අගෝස්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, සියලුම රාජ්‍ය ආයතනවල නිලධාරීන් බඳවා ගැනීම, ඉල්ලා අස්වීම,	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ආයතනවලට අදාළව අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කිරීම.

	සේවය අත්හැර යාම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැනීම් සහ මිය යෑම් වැනි කරුණුවලට අදාළව සිදුවන වෙනස්වීම් දක්වමින් රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාමේ හා යාවත්කාලීන කිරීමේ වගකීම, දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණද, එකී වගකීම ඉටුකර ඇති බවට තහවුරු නොවුණි.	විස්තර ඇතුළත් තොරතුරු වාර්තා 2019 වර්ෂයෙන් පසුවත් එනම් 2020, 2021, 2022, 2023 හා 2024 යන වර්ෂවලට අදාළව මුදල් අමාත්‍යාංශය විසින් සකස් කරනු ලැබූ වාර්ෂික වාර්තාවන්ට රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය පිළිබඳ දත්ත හා තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිසි පරිදි සපයා ඇති අතර එම වාර්ෂික වාර්තාවන් නියමිත කාල සීමාවන් තුළදී අමාත්‍ය මණ්ඩලය වෙත හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි.	
(ඇ)	2017 ජනවාරි 21 දිනැති අංක 01/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි, රාජ්‍ය ආයතනවල කාර්යයන් ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය හඳුනාගෙන, ඒ පිළිබඳව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරීමට හා එම තොරතුරු පදනම්ව කාර්ය මණ්ඩල සමාලෝචන කමිටුවක් මඟින් එක් එක් ආයතනයට අවශ්‍ය ප්‍රශස්ත කාර්ය මණ්ඩලය තීරණය කිරීමට නියමිතව තිබුණි. එසේවුවද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් රාජ්‍ය ආයතන 1027 ක් අතරින් ආයතන 765 ක කාර්යමණ්ඩල සමාලෝචන වාර්තාවන් ලබා ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.	කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2017 අනුව සිදු කරන කාර්ය මණ්ඩල සමාලෝචනයේදී හඳුනා ගන්නා ලද සේවා අවශ්‍යතා පදනම් කර ගනිමින් පළාත් සෞඛ්‍ය සේවය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර ඇති අතර අනතුරුව විශ්වවිද්‍යාල සඳහා අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය ද, ජාතික පාසල් සහ පළාත් සභා පාසල්වල අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පාසල් පාදක කාර්ය මණ්ඩලයක් ද අනුමත කර ඇති බවත් මෙම වර්ෂයේදී කෘෂිකර්ම හා සෞඛ්‍ය අංශයන්හි සහ පළාත් සභා කාර්ය මණ්ඩල සමාලෝචනය සිදු කිරීම සඳහා දැනුවත් කිරීම් සිදු කර අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බවත් දන්වා තිබුණි.	චක්‍රලේඛ උපදෙස් වලට අනුව කටයුතු කිරීම.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇස්තමේන්තුගත පිරිවැයත් සත්‍ය පිරිවැයත් සැසඳීමේදී වැය විෂයයන් 2ක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා වියදම් දරා ඇති බවත්, වැය විෂයයන් 4 ක් සඳහා ඇස්තමේන්තුගත	අනපේක්ෂිත නඩත්තු කටයුතු දැරීමට සිදුවීම, යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට සිදුවීම නිසා අමතර ප්‍රතිපාදන ලබාගැනීම. ලිපිද්‍රව්‍ය අදාල කාලය තුල නොලැබීම, ස්ථාවර වත්කම් අළුත්වැඩියාව සඳහා ඉල්ලීම් ඉදිරිපත්	නිවැරදිව හා තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කල යුතු වීම.

පිරිවැයට වඩා අඩුවෙන් වියදම් දරා ඇති බවත් එක් වැය විෂයයක් සඳහා ඇස්තමේන්තුගත කර තිබුනද, කිසිදු වියදමක් දරා නොමැති බවත් නිරීක්ෂණය විය.	නොවීම, වියදම් සීමා කිරීම නිසා ප්‍රතිපාදන ඉතිරිවී ඇත.	

5. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 91 ක් වූ අතර, ඉන් තනතුරු 12 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක් සහ ද්විතීයික මට්ටමේ තනතුරු 04 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් ද විය. ඒ අනුව, පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.	ඉදිරි බඳවා ගැනීම්වලදී පුරප්පාඩු පිරවීමට අපේක්ෂා කරනු ලැබේ.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම.